www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ මිලිටරිය සමග ලිපි හුවමාරුවක්

**An exchange of letters with the Sri Lankan military**

**2004 අප්‍රේල් 9**

*"ශ්‍රී ලංකා ජෙනරාල් ඉන්දියාවේ ඉහල පෙලේ සංචාරයක" යන මැයෙන් ජනවාරි 6 දා ලෝක සමාජවාදී වෙබ් අඩවියේ (ලෝසවෙඅ) පල වූ ලිපිය මගින්, පසුගිය දෙසැම්බරයේ දී ශ්‍රී ලංකාවේ ආරක්ෂක කාර්ය මන්ඩලයේ ප්‍රධානී එල්.පී. බලගල්ල, ඉන්දියාවට සිදු කල සංචාරය, වැරදි ලෙස වාර්තා කෙරී ඇතැයි, කියා පාමින්, ජනවාරි 14 දා ශ්‍රී ලංකා මිලිටරිය විසින් එවන ලද ලිපියක් ලෝසවෙඅ වෙත ලැබුනි. අපගේ ලිපිය පරෙස්සමින් සමාලෝචනයට ලක් කිරීමෙන් අනතුරුව, ලෝසවෙඅ, එම චෝදනාව ප්‍රතික්ෂේප කරමින්, මිලිටරිය වෙත පිලිතුරු ලිපියක් යැවී ය. මිලිටරියේ ලිපියත්, ලෝසවෙඅ ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සාමාජික කේ. රත්නායක විසින් යවන ලද පිලිතුරත් අපි පහත පල කරමු.*

ලෝක සමාජවාදී වෙබ් අඩවිය,

"ශ්‍රී ලංකා ජෙනරාල් ඉන්දියාවේ ඉහල පෙලේ සංචාරයක" යන මැයෙන් ලෝක සමාජවාදී වෙබ් අඩවියේ පල වූ ලිපිය (2004 ජනවාරි 6)

1. ඉහත සඳහන් ප්‍රවෘත්ති ලිපිය පිලිබඳව ඔබගේ කාරුනික අවධානය යොමු කිරීමට කැමැත්තෙමි. එම ලිපිය තුල, ආරක්ෂක කාර්ය මන්ඩලයේ ප්‍රධානී සහ යුද හමුදාපති මෑත දී ඉන්දියාවට සිදු කල සංචාරය, වැරදි ලෙස අර්ථකථනය කොට වැරදි ලෙස වාර්තා කෙරී ඇත.

2. ආරක්ෂක කාර්ය මන්ඩලයේ ප්‍රධානී සහ යුද හමුදාපති, ලුතිනන් ජෙනරාල් එල්.පී. බලගල්ල, ඉන්දියාවේ සංචාරයක යෙදුනේ, ආරක්ෂක අමාත්‍යාංශය ආන්ඩුව යටතේ පැවති විට, ඉන්දියාවේ යුද හමුදා කාර්ය මන්ඩලයේ ප්‍රධානී විසින් කරන ලද ආරාධනාවකට අනතුරුව, ආන්ඩුව විසින් කරන ලද යෝජනාවක් මත ය.

3. අති ගරු ජනාධිපති තුමිය කලේ, සන්නද්ධ හමුදාවන්ගේ ප්‍රධාන අන දෙන නිලධාරිනිය ලෙස ඇයට යොමු කරන ලද ආන්ඩුවේ යෝජනාව අනුමත කිරීම පමන ය.

4. එබැවින් ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ලිපිය, නොමග යවන සුලු සහ සාවද්‍ය හා විකෘත අදහසක් නිර්මානය කරයි. ඒ මක් නිසා ද යත්, එය මගින්. ලුතිනන් ජෙනරාල් බලගල්ල, ජනාධිපති නියෝජිතයකු ලෙස, තමන් ම, එම සංචාරයේ යෙදුනේ ය යන අදහස, පැහැදිලිවම ඉදිරිපත් කරන බැවිනි.

5. මෙම නිවැරදි කිරීම, ඔබගේ වෙබ් අඩවියේ, හැකි තරම් කඩිනමින්, ප්‍රමුඛ තැනක් දෙමින් පල කෙරෙන්නේ නම්. එය අගය කරමි. මේ පිලිබඳ තව දුර පැහැදිලි කිරීම් හා විස්තර අවශ්‍ය නම්, ඒවා යුද හමුදා මූලස්ථානයේ මාධ්‍ය අධ්‍යක්ෂ මන්ඩලය වෙතින් ලබා ගත හැකි ය.

6. මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගිතාව බෙහෙවින් අගය කරමි.

අත්සන් කලේ,
ඒ.කේ.එස්. පෙරේරා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී,
කර්නල්,
යුද හමුදා ප්‍රකාශක

ප්‍රිය කර්නල් පෙරේරා,

*ලෝක සමාජවාදී වෙබ් අඩවිය* වෙත එවූ ජනවාරි 14 දාතැමති ඔබගේ ලිපියේ මතු කර තිබූ කරුනු පරෙස්සමින් සමාලෝචනයට ලක් කිරීමෙන් අනතුරුව, අපට පසක් වූයේ, "ශ්‍රී ලංකා ජෙනරාල් ඉන්දියාවේ ඉහල පෙලේ සංචාරයක" යන මැයෙන් වූ අපගේ ලිපිය සම්බන්ධයෙන් ඔබ කරන ප්‍රකාශයන්ට කිසිදු පදනමක් නැති බවයි. එබැවින්, අපගේ ලිපිය මගින්, ආරක්ෂක කාර්ය මන්ඩලයේ ප්‍රධානී ලුතිනන් ජෙනරාල් එල්.පී. බලගල්ලගේ පසුගිය දෙසැම්බර් සංචාරය, "වැරදි ලෙස අර්ථකථනය" කෙරී නැතහොත් "වැරදි ලෙස වාර්තා කෙරී" ඇතැයි යනුවෙන් ඔබ කරන චෝදනාව ප්‍රතික්ෂේප කරමු.

ඔබගේ ලිපියෙන් මතු කෙරෙන සාරයකින් යුත් එකම කාරනය, තර්ක දෙකක් මත පදනම් වෙයි. පලමු වැන්න නම්, ජෙනරාල් බලගල්ල ඉන්දියාවේ සංචාරයක යෙදුනේ, "(ශ්‍රී ලංකාවේ) ආරක්ෂක අමාත්‍යාංශය ආන්ඩුව යටතේ පැවති විට, ඉන්දියාවේ යුද හමුදා කාර්ය මන්ඩලයේ ප්‍රධානී විසින් කරන ලද ආරාධනාවකට අනතුරුව, ආන්ඩුව විසින් කරන ලද යෝජනාවක් මත ය." යන්න ය. දෙවැන්න නම්, "අති ගරු ජනාධිපති තුමිය කලේ, සන්නද්ධ හමුදාවන්ගේ ප්‍රධාන අන දෙන නිලධාරිනිය ලෙස ඇයට යොමු කරන ලද ආන්ඩුවේ යෝජනාව අනුමත කිරීම පමන ය". මෙම පදනම මත, ඔබ නිගමනය කරන්නේ, අපගේ ලිපිය, "නොමග යවන සුලු සහ සාවද්‍ය හා විකෘත අදහසක් නිර්මානය කරයි. ඒ මක් නිසා ද යත්, එය මගින්, ලුතිනන් ජෙනරාල් බලගල්ල, ජනාධිපති නියෝජිතයකු ලෙස, තමන් ම, එම සංචාරයේ යෙදුනේ ය යන අදහස, පැහැදිලිවම ඉදිරිපත් කරන බැවිනි" යනුවෙනි.

සිද්ධීන්ගේ සැබෑ අනුපිලිවෙල සවිස්තරාත්මකව පරීක්ෂාවට ලක් කිරීමෙන් අනතුරුව, පෙනී යන්නේ,

ඔබගේ ලිපියේ සැබෑ අරමුන, සිදු වූ දෙය වසං කිරීම බවයි. ජෙනරාල් බලගල්ලගේ සංචාරය සඳහා ආරම්භක ආරාධනාව ලැබුනේ, ශ්‍රී ලංකා ආරක්ෂක අමාත්‍යංශය එක්සත් ජාතික පෙරමුනු (එජාපෙ) ආන්ඩුව යටතේ පැවති කල ය යන්න සත්‍ය ය. එය, පසුගිය ඔක්තෝබරයේ අගමැති රනිල් වික්‍රමසිංහගේ ම ඉන්දියානු සංචාරයේ ප්‍රතිඵලයක් විය. ජෙනරාල් බලගල්ලගේ සංචාරය, නොවැම්බර් මුල සිදු කිරීමට සැලසුම් කෙරුනු අතර, එයට, සන්නද්ධ හමුදාවල ප්‍රධාන අන දෙන නිලධාරි ලෙස ජනාධිපතිගේ ආකාරගත අනුමැතිය ද ලැබුනි.

එහෙත් නොවැම්බර් 4 දා, සිද්ධීන් නාටකාකාර ලෙස වෙනසකට භාජන විය. ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග, ඒකපාර්ශ්වීය ලෙස හා ප්‍රජාතන්ත්‍ර විරෝධී ලෙස, ආරක්ෂක අමාත්‍යංශය ද ඇතුලු මූලික අමාත්‍යංශ තුනක් පවරා ගත්තා ය. මාධ්‍ය වාර්තා ගනනාවකට අනුව, ජෙනරාල් බලගල්ලගේ සැලසුම් කෙරුනු සංචාරය, ජනාධිපති හා ආන්ඩුව අතර පැවති දේශපාලන අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස, කල් දැමුනි. සංචාරය යලි සැලසුම් කෙරුනේ, ආරක්ෂක අමාත්‍යංශය, ආන්ඩුවේ නො ව, ජනාධිපතිගේ, පාලනය යටතේ පවතින විට ය. දෙසැම්බර් 8 දායින් ආරම්භව දින හතරක් තිස්සේ සංචාරය සිදු කෙරුනි.

ඉන්දියානු ආරක්ෂක ඇමති, විදේශ අමාත්‍යංශ නිලධාරින් හා මිලිටරි ප්‍රධානීන් සමග සාකච්ඡා ද ඇතුලත් වූ මෙම ඉහල පෙලේ සංචාරය සැලසුම් කිරීම පිලිබඳ වගකීම පැවතියේ, තත්වාකාර ආරක්ෂක ඇමති ලෙස, ජනාධිපති අත ය. එය ශ්‍රී ලංකා ආන්ඩුවේ පිලිවෙත සමග ඍජුව ගැටුනා වූ නමුදු, කුමාරතුංග, බලගල්ල හෝ ඔවුනගේ නියෝජිතයන්, අදාල ආන්ඩුවේ ඇමතිවරුන් කිසිවකු සමග සංචාරය පිලිබඳව සාකච්ඡා කල බවට හෝ ඔවුනගේ අනුමැතිය ඉල්ලා සිටි බවට හෝ කිසිදු සාක්ෂියක් නැත.

තථ්‍ය ලෙස ම සිදු වූයේ කුමක් ද යන්න තහවුරු කරගනු පිනිස, අපි ජ්‍යෙෂ්ඨ ඇමතිවරුන් තිදෙනකුගෙන් මෙම කාරනාව පිලිබඳව විමසුවෙමු.

පෙබරවාරි 19 දා, අපගේ මාධ්‍යවේදියෙක්, ආන්ඩුවේ මාධ්‍ය කේන්ද්‍රයේ පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවකට සහභාගි වූ අතර, එහි දී, හිටපු ආරක්ෂක ඇමති තිලක් මාරපනගෙන්, දෙසැම්බර් මස බලගල්ලගේ ඉන්දියානු සංචාරය සඳහා ආන්ඩුවේ අනුමැතිය ඉල්ලා සිටියේ ද යන්න, විමසී ය. ඔහු මෙසේ පිලිතුරු දුනි: “මං දන්නෙ නෑ. මාව ආරක්ෂක ඇමති ධුරයෙන් ඉවත් කලාට පස්සෙ, මම ඒ අමාත්‍යංශයේ කිසිදු කටයුත්තක් ගැන සොයා බැලුවේ නැහැ.”

පෙබරවාරි 22 දා. *ලෝසවෙඅ* වාර්තාකරුවෙක්, කොලඹ නගර සභා පිටියේ පැවති එජාප විශේෂ සම්මේලනයට ගිය අතර. එහි දී විදේශ ඇමති ටිරොන් ප්‍රනාන්දුගෙන් එම ප්‍රශ්නය ම ඇසුවේ ය. ප්‍රනාන්දුගේ පිලිතුර වූයේ, විදේශ අමාත්‍යංශයට සංචාරය ගැන “දැනුම් දුන්” බව පමනි.

පෙබරවාරි 25 දා, ප්‍රවෘත්ති සාකච්ඡාවක දී, අපි කැබිනට් ප්‍රකාශක ජී.එල්. පීරිස්ගෙන් ද ප්‍රශ්න කලෙමු. ඔහු මෙසේ ප්‍රකාශ කලේ ය: “නැහැ. ආන්ඩුවෙන් එවන් අනුමැතියක් අවශ්‍ය වුනේ නැහැ. ඒ වන විට ආරක්ෂක අමාත්‍යංශය එතුමිය (ජනාධිපති) යටතේ තිබුනු නිසා, ඕනෑම ආරක්ෂක නිලධාරියකුට එවන් සංචාරයක යෙදෙන ලෙස පැවසීමට එතුමියට පුලුවන්.”

මෙම පිලිතුරුවලින් පැහැදිලි වන්නේ, සංචාරයට අනුමැතිය දීම හෝ එය සංවිධානය කිරීම හෝ අරභයා කිසිදු මැදිහත්වීමක් ආන්ඩුවෙන් හෝ එහි ඇමතිවරුන්ගේ පාර්ශ්වයෙන් සිදු නො වූ බවයි. ඇත්ත වසයෙන් ම, ජනාධිපති හා ආරක්ෂක සංස්ථාපිතය, විෂයයන් ගනනාවක් සම්බන්ධයෙන්. ආන්ඩුවට දැනුම්දීමක් පවා නොමැතිව, ස්වාධීනව ක්‍රියා කොට තිබේ. අපගේ ලිපිය පල වීමට සෑහෙන කලකට පෙර, මෙම කරුන පෙන්වා දෙමින්, කොලඹ මාධ්‍ය තුල ලිපි ගනනාවක් ම පල විය.

අපගේ ලිපිය මගින් අවධානයට යොමු කොට ඇති පරිදි, *සන්ඩේ ටයිම්ස්* පත්‍රයේ ආරක්ෂක ලියුම්කරු ඉක්බාල් අතාස්, දෙසැම්බර් 21 දා මෙසේ ලිවී ය: “ආරක්ෂක විෂය සම්බන්ධයෙන් ගනු ලබන තීන්දු මාධ්‍ය වෙතින් දැන ගැනීමට සිදුව ඇත්තේ, අගමැති රනිල් වික්‍රමසිංහට ය. ඇත්ත වසයෙන් ම, ඔහු සිය විශ්වාසවන්තයකුට කියා සිටියේ, ආරක්ෂක විෂය ක්ෂේත්‍රය ආන්ඩුවෙන් ඉවත් කෙරුනු තැන් පටන්, තමන්ට හෝ තමන් විසින් නම් කෙරුනු කවරෙකුට හෝ කිසිදු ආකාරගත නිල වාර්තාවක් නො ලැබෙන බවයි. . . . ”

ආන්ඩුවට දැනුම් දීමට කුමාරතුංග අපොහොසත් වීම, හුදු ආකාරගත රාජ්‍ය චාරිත්‍ර විධික්‍රම පිලිබඳ කාරනාවක් නො වේ. මෙම සිද්ධීන් ඇති වූයේ, කොලඹ පාලනයේ ගැඹුරු දේශපාලන අර්බුදයක් ද දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය සමග සාකච්ඡා ගෙන යාමේ දී ජාතික ආරක්ෂාව සුරැකීමට ආන්ඩුව අපොහොසත්ව ඇත යන චෝදනාව අරභයා, ජනාධිපති හා ආන්ඩුව අතර, ඇති වූ තියුනු මතභේදයක් ද මධ්‍යයේ ය.

බලගල්ලගේ සංචාරයේ ක්‍රියාදාමය අප සදොස් ලෙස වාර්තා කොට ඇතැයි කියමින් ඔබ අපව විවේචනයට ලක් කරන අතර ම, අපගේ ලිපිය මගින් මතු කෙරී ඇති ඊට වඩා බැරෑරුම් කරුනක් ඔබගේ විරෝධයට ලක් නො වීම, අර්ථභාරී ය. එනම්, ජනාධිපති සහ ආන්ඩුව අතර “ගැටුම තුල, ශ්‍රී ලංකා මිලිටරියේ ඉහල කොටස්, විවෘත දේශපාලන ක්‍රියාකලාපයක්, කෙතරම් නම් පරිමානයකට ඉටු කරත් ද යන වග, මෙම සංචාරය මගින් එලිදරව් විය.” යන සඳහනයි. මිලිටරිය ජනාධිපතිට දේශපාලනිකව සහයෝගය දෙන බවට කිසිදු විවෘත ප්‍රකාශයක් කොට නැති නමුදු, එය, කිසිසේත් ම, අපක්ෂපාතීව පසෙකට වී බලා සිටින්නෙක් නම් නො වේ.

ඇත්ත වසයෙන් ම, කුමාරතුංග ම, නොවැම්බර් 14 දා *ෆිනෑන්ෂියල් ටයිම්ස්* පත්‍රයට අදහස් දක්වමින් කියා සිටියේ, යම් ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස මිලිටරිය ඇත්තට ම ඇයගෙන් ඉල්ලූ බවයි. “(ආරක්ෂක) තත්වය පිලිබඳ නිල වාර්තා නාවික හමුදාවෙන් හා යුද

හමුදාවෙන් මට ලැබුනු කල, ඔහු ඒ සම්බන්ධයෙන් කිසිවක් නො කරන බව මා අගමැතිට (වික්‍රමසිංහට) නිරතුරුවම පැවසූ කල, . . . ඔවුහු (ආන්ඩුවේ ඇමතිවරුන්) ‘ඔබට කොහොමද මේ තොරතුරු ලැබුනේ?’ යයි අසමින් ඒවා දිගටම නො තකා හැරියහ. නමුත් යුද හමුදාව හා නාවික හමුදාව වඩ වඩාත් නොසන්සුන් වෙමින් ‘මේ ගැන යමක් කරන්න’ යයි මගෙන් ඉල්ලා සිටියේ ය.”

නොවැම්බර් 4 දා, සිදු වූ දෙය විස්තර කල හැක්කේ ව්‍යවස්ථා කුමන්ත්‍රනයක් ලෙස පමනකි. එදින, කුමාරතුංග, අමාත්‍යාංශ තුනක් පවරාගෙන, පාර්ලිමේන්තුව සති දෙකකට කල් තබා, මූලික ස්ථානවලට හමුදාව යොදවා, හදිසි නීතිය පැනවීමට ද සූදානම් වූවා ය. ඇය පසු බැස්සේ, වොෂිංටනය, නව දිල්ලිය සහ සෙසු රටවල් දේශපාලනික පීඩනය යෙදූ පසුව පමනි, යන්න ප්‍රසිද්ධ කරුනකි. ඉන්දියානු අගමැති අතාල් බෙහාරි වජ්පායි, නොවැම්බර් 7 දා පැය දෙකක් තිස්සේ ජනාධිපතිට කතා කරමින්, ඊනියා සාම ක්‍රියාදාමය අනතුරේ හෙලන කිසිවක් නො කරන ලෙස ඇයගෙන් ඉල්ලා සිටියේ ය.

ජෙනරාල් බලගල්ල සිය ඉන්දියානු සංචාරය සිදු කලේ, මෙම සිද්ධීන්ට අනතුරුව ය. සංචාරයේ විස්තර මගින් පෙන්නුම් කෙරෙන්නේ, එය වනාහි චාරිත්‍රානුකූල උත්සවකාරී අවස්ථාවක් වත් හුදු තොරතුරු සෙවීමේ දූත මෙහෙයක් වත් නො වන බවයි. ජෙනරාල් බලගල්ල, ආකාරගතව ජනාධිපති නියෝජිතයකු ලෙස කතා නො කල නමුදු, ඔහු නිසැකව ම ක්‍රියා කලේ එවැන්නකු ලෙස ය. ශ්‍රී ලංකාවේ ආරක්ෂක තත්වය සහ එල්ටීටීඊයේ ක්‍රියාකාරකම් පිලිබඳව, වෙනත් වචනවලින් කිය තොත්, ජනාධිපති හා ආන්ඩුව අතර මතභේදයට අදාල ප්‍රධාන කරුනු පිලිබඳව, ඔහු, ඉන්දියානු මාධ්‍යවලට හා ආරක්ෂක සංස්ථාපිතයට, පැහැදිලි කලේ ය.

ජෙනරාල් බලගල්ලගේ ප්‍රකාශ, ජනාධිපතිගේ ක්‍රියාවන් යුක්තියුක්ත කිරීමකට සම වන අතර, ඉන්දියානු හා ජාත්‍යන්තර ප්‍රවෘත්ති මාධ්‍ය තුල ඒවා පුලුල්ව වාර්තා කෙරුනි. නිදසුනක් ලෙස, දෙසැම්බර් 9 දා *දි අයිලන්ඩ්* පත්‍රයේ පල කෙරුනු *ඒඑෆ්පී* වාර්තාවක්, කාශ්මීරයේ පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවක දී ඔහු දැක්වූ අදහස් උපුටා දැක්වී ය: “ඔවුහු (එල්ටීටීඊය) සූදානම් වෙමින් සිටී. ඔවුහු පසුව ඕනෑම පියවරක් ගැනීමේ සූදානමින් දැනට තීන්දුවක් ගැනීම මගහැරගෙන සිටී. ඔවුහු මිනිසුන් බඳවා ගනිමින් සිටී. ඔවුහු ආයුධ හා උන්ඩ රැස් කරමින් සිටී. ඒවා පිටතින් ගෙන එයි. නීති විරෝධී ප්‍රවාහනය. . . . කිසියම් අහිතකර තත්වයක් ඇති වුව හොත් අපි ද එයට සූදානම් වෙමින් සිටිමු.”

මේවා දේශපාලනිකව සංවේදී හා පාක්ෂික ප්‍රකාශයන් බවත් එජාපෙ ආන්ඩුව හෝ එහි ඇමතිවරුන් මෙවන් ප්‍රකාශ නො කරනු ඇති බවත් පිලිබඳ කිසිදු සැකයක් නැත. ඉන්දියාවේ පැවති සාකච්ඡාවලට ප්‍රස්තුත වූ කාරනාව, මතභේදයට තුඩු දේ ඇති කරුනු වන අතර, ආන්ඩුවට එරෙහි කුමාරතුංගගේ විවේචනයන්ට ද සෘජුවම සම්බන්ධ ය.

යාපනයේ පලාලි ගුවන් තොටුපල වැඩි දියුනු කිරීම, ශ්‍රී ලංකා නාවික හමුදාවට ප්‍රවාහන පහසුකම් සැපයීම, ඉන්දියානු හා ශ්‍රී ලංකා නාවික හමුදාවන් ඒකාබද්ධ මුර සංචාරයන්හි යෙදීම සහ රහස් ඔත්තු තොරතුරු බෙදාහදා ගැනීම ඇතුලු, ඉන්දියාව සමග ආරක්ෂක සබඳතා වර්ධනය කරගැනීම පිලිබඳ සාකච්ඡාවල තමන් නිරතව සිටි බව, ජෙනරාල් බලගල්ල, ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ දී පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවල දී එලි කලේ ය. මෙම සියලු පියවරයන්ගේ එල්ලය වූයේ. එල්ටීටීඊයට එරෙහිව ශ්‍රී ලංකා මිලිටරිය ශක්තිමත් කිරීමයි.

ජෙනරාල් බලගල්ල, ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර ආරක්ෂක සහයෝගිතා ගිවිසුමක් (ඩීසීඒ) ඉක්මන් කරගැනීම ගැන ද සාකච්ඡා කලේ ය. එවන් ගිවිසුමකට ආරක්ෂාව මෙන් ම වෙලඳ හා විදේශ පිලිවෙත් සම්බන්ධයෙන් දුර දිග යන ඇඟවුම් පවතී. ආන්ඩුව හා එහි ඇමතිවරුන් මෙම කටයුතුවලට සහභාගි නො වූ අතර, ජනාධිපති ඒවාට මැදිහත් විය. දෙසැම්බර් 14 දා *සන්ඩේ ටයිම්ස්* පත්‍රය මෙසේ වාර්තා කලේ ය: “අපට දැනගන්ට ලැබී ඇති පරිදි, ආරක්ෂක සහයෝගිතා ගිවිසුම සම්බන්ධිත කාරනා පිලිබඳව, ෆර්නැන්ඩෙස් ඇමතිතුමා සහ ඉන්දියානු නිලධාරීන් සමග, සාකච්ඡා කරන ලෙස, ජනාධිපතිනි කුමාරතුංග ලුතිනන් ජෙනරාල් බලගල්ලට කියා ඇත.”

මෙම සාකච්ඡාවලින් අනතුරුව, ආරක්ෂක සහයෝගිතා ගිවිසුම කඩිනම් කරනු පිනිස, කුමාරතුංග, ජනවාරි 15 දා නව දිල්ලියට දෙවන වරටත් නියෝජිත කන්ඩායමක් යැවුවා ය. මෙම නියෝජිත කන්ඩායමට, ජෙනරාල් බලගල්ල, ආරක්ෂක ලේකම් සිරිල් හේරත් සහ ජනාධිපති නීති උපදේශක නිගෙල් හැච් ඇතුලත් වූ අතර, එහෙත්, ආන්ඩුවේ පාලනය යටතේ පැවති අමාත්‍යාංශවලින්, විදේශ අමාත්‍යාංශයෙන් පවා, එකදු නිලධාරියකු හෝ, ඇතුලත් නො වී ය.

සිදුව ඇති දේ පිලිබඳව දිය හැකි එකම පැහැදිලි කිරීම නම්, ජෙනරාල් බලගල්ල, පැවති ඡන්දයෙන් තේරී පත්වූ ආන්ඩුවේ අදහස් විමසීමකින් තොරව, ඉන්දියාවට යැවූ “ජනාධිපතිනියගේ නියෝජිතයකු මෙන් ම” ක්‍රියා කල බවයි. එබැවින්, මිලිටරිය විසින් ඉටු කරනු ලබන දේශපාලන ක්‍රියාකලාපය පිලිබඳ අප කල මනා අනතුරු ඇඟවීම, මුලුමනින්ම යුක්තියුක්ත හා කාලෝචිත අදහස් දැක්වීමකි.

මීට,

හිතවත්,

කේ. රත්නායක,

ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩලය.

© www.wsws.org